සඳහා ගාස්තුවකට යටත්ව එහි වාරික මුදල අදාළ සමාගම ඔබ වෙත ආපසු ගෙවනු ලැබේ. එමෙන්ම වසර තුනක කාලයක් අඛණ්ඩව වාරික මුදල් ගෙවා ඇති විට ඔබේ රක්ෂණයට මුදල් අගයක් හෙවත් පවාරණ අගයක් ආරෝපණය වේ. එහි පවාරණ අගය රක්ෂණ සමාගමේ ජීවගණකඥ විසින් සහතික කරනු ලැබේ. ඔබේ රක්ෂණ ඔප්පුවේ පවාරණ අගය හා සම්බන්ධ විධිවිධාන කියවා ඒ පිළිබඳ අවබෝධයකින් යුතුව සිටින්න. ඉහත අවස්ථාවන් දෙක හා රක්ෂණ ඔප්පුවට ආදාල ප්‍රතිලාභ ලැබීමට අමතරව වෙනත් කිසිදු අවස්ථාවකදී ඔබ ගෙවූ වාරික මුදලින් කොටසක් හෝ නැවත ලබා ගත නොහැක. අදාල රක්ෂණ ගිවිසුම අත්සන් කිරීමට පෙර මෙම විධිවිධාන පිළිබඳව ඔබේ රක්ෂණ නියෝජිතවරයාගෙන් හා/හෝ අදාල රක්ෂණ සමාගමේ නිලධාරිවරයාගෙන් සියළු කරුණු ආශ්‍රිත පැහැදිලි කිරීමක් ලබාගන්න.

## 9. ඔබගේ රක්ෂණ ඔප්පුව අවලංගු වූ විට කල යුත්තේ කුමක්ද?

රක්ෂණ ඔප්පුවෙහි සඳහන් ඇතැම් කොන්දේසි යටතේ පූර්ණ බලාත්මක බවකින් යුතුව එය ප්‍රකෘතිමත් කිරීමට හෝ ප්‍රතිස්ථාපනය කිරීමට හෝ ඔබට පිළිවන. එසේ ප්‍රතිස්ථාපනය කරනු ලබන අවස්ථාවේදී ඔබේ සෞඛ්‍ය තත්වය පිළිබඳව ප්‍රකාශයක් කිරීමට, රක්ෂණ සමාගම ඔබෙන් ඉල්ලා සිටීමට ඉඩ ඇත. යම් හෙයකින් ඔබගේ සෞඛ්‍ය තත්වය පිළිබඳ රක්ෂණ සමාගම සෑහීමකට පත් නොවේ නම් අදාල රක්ෂණ ඔප්පුව බලාත්මක නොකිරීමට රක්ෂණ සමාගමට හැකියාවක් තිබේ.

## 10. ඔබගේ රක්ෂණ ඔප්පුව නැතිවූ විට කළ යුත්තේ කුමක්ද?

යම් හෙයකින් රක්ෂණ ඔප්පුව විනාශ වූවහොත් හෝ අස්ථානගත වූවහොත් අදාළ රක්ෂණ සමාගම වෙත වහාම ඒ බව ලිඛිතව දැනුම් දෙන්න. එවිට අදාළ රක්ෂණ සමාගම විසින් ඒ සම්බන්ධයෙන් අදාළ විමර්ෂණ කටයුතු කර යම් කිසි මුදලකට යටත්ව නැතිවූ හෝ විනාශ වූ ඔප්පුවේ සහතික කළ අනුපිටපතක් නිකුත් කරනු ලැබේ. එමෙන්ම රක්ෂණ ඔප්පුවේ ඡායාපිටපතක් ළඟ තබා ගැනීම හෝ එහි අංකය වෙනත් ස්ථානයක ලියා තබාගැනීම බෙහෙවින් ප්‍රයෝජනවත් විය හැකිය.

## 11. රක්ෂණය කල් පිරුණු විට කළ යුත්තේ කුමක්ද?

අදාළ රක්ෂණ වර්ගය සඳහා කල් පිරීමේ දිනයක් ඇති විට අදාළ රක්ෂණ සමාගම සාමාන්‍යයෙන් ඔබ වෙත ඒ බව කල්වේලා ඇතිව දැනුම් දෙනු ලැබේ. නිදහස් කිරීමේ ආකෘති පත්‍ර කිසිවක් පිරවීමට අමතරව, රක්ෂණ ඔප්පුවේ මුල් පිටපත ඉදිරිපත් කරන ලෙස ඔබෙන් ඉල්ලා සිටින අතර අදාළ රක්ෂණ ඔප්පුවට අයත් ප්‍රතිලාභ ඔබ විසින් ලබා ගැනීමට අදහස් කරන ආකාරය පිළිබඳව ද එහිදී උපදෙස් ලබා දිය යුතුය.

## 12. හිමිකම් පෑමක් ඉදිරිපත් කිරීම සඳහා වූ සිද්ධියක් උද්ගත වූ විට ඔබ කළ යුත්තේ කුමක්ද?

හිමිකම් පෑමක් ඉදිරිපත් කිරීම සඳහා වූ සිද්ධියක් උද්ගතවූ විට රක්ෂණ ඔප්පුවේ දක්වා ඇති පරිදි ඒ පිළිබඳව හැකි ඉක්මනින් රක්ෂණ සමාගම දැනුවත් කළ යුතුය. රක්ෂණ ඔප්පුවේ සඳහන් කාල සීමාව ඇතුළත ඒ බව දැන්වීමට ඔබ හෝ ඔබගේ නාමයෝජකයා/ ප්‍රතිලාභියා අපොහොසත් වුවහොත් අදාල සිද්ධිය සඳහා රක්ෂණ හිමිකම් ඉල්ලා සිටීමේ අයිතිය අහිමිවී යා හැකිය. වෛද්‍ය ප්‍රතිකාර/රෝහල් ගතවීම අවශ්‍ය වූ අවස්ථාවකදී අදාළ වෛද්‍යවරයා හෝ රෝහලෙන් පිටවයාමට පෙර සියලු වෛද්‍ය වාර්තා/රෝග නිශ්චය කිරීමේ කාඩ්පත් කරුණාකර ලබාගන්න. මක්නිසාද යත්, නැවතත් අදාළ වෛද්‍යවරුන් වෙත යාම අපහසුවිය හැකි බැවිනි. ඔබගේ හිමිකම් පෑමට අදාළ අවශ්‍ය කටයුතු කඩිනමින් ඉටුකිරීම සඳහා රක්ෂණ සමාගම විසින් පත්කරනු ලබන නිලධාරියාට ඔබගේ සහයෝගය ලබාදීමට කටයුතු කරන්න.

## 13. ප්‍රධාන ජීවිත රක්ෂණ වර්ග මොනවාද?

* කාලීක රක්ෂණය (Term Assurance)
* යාවජීව රක්ෂණය (Whole Life Assurance)
* උපපාදන රක්ෂණය (Endowment Assurance)
* අවරෝහණ කාලික රක්ෂණය (Decreasing Tearm Assurance)
* ආයෝජන සම්බනධිත රක්ෂණය (Investment Linked Assurance)

INSURANCE REGULATORY COMMISSION OF SRI LANKA

# ජීවිත රක්ෂණය පිළිබඳ ඔබ දැනුවත්ද




**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**
11 වන මහල, නැගෙනහිර කුළුන
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
කොළඹ 01.
දුරකථන : 0112 396 184-9
ෆැක්ස් : 0112 396 190-1
ඊමේල් ලිපිනය : info@ircsl.gov.lk
වෙබ් අඩවිය : www.ircsl.gov.lk



(ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් ප්‍රකාශයට පත් කරන ලදී)

## 1. ජීවිත රක්ෂණය යනු කුමක්ද?

යම් පුද්ගලයකු අනාගතයේ තම ජීවිතය සම්බන්ධයෙන් සිදු විය හැකි අනපේක්ෂිත අවදානම් වලට මුහුණ දීමට හා එම අවදානම් කළමණාකරණය කරගැනීම සඳහා රක්ෂණ සමාගමක් සමග ඇති කරගන්නා නීතිමය ගිවිසුමක් ජීවිත රක්ෂණයක් ලෙස හැඳින්වේ. රක්ෂිතයා ( රක්ෂණ ඔප්පුහිමියා) මියයාම මත හෝ රක්ෂණ ඔප්පුව කල්පිරීම මත ජීවිත රක්ෂණයේ ප්‍රතිලාභ, රක්ෂිතයා විසින් නම් කරන ලද ප්‍රතිලාභියෙකුහට හෝ රක්ෂිතයාට ගෙවීමට රක්ෂණ සමාගම පොරොන්දු වේ. රක්ෂිතයා විසින් ලබා ගන්නා ජීවිත රක්ෂණය අනුව, රෝගාබාධ හෝ බරපතල රෝග වැනි අනෙකුත් සිදුවීම් සඳහාද එකඟ වූ පරිදි ගෙවීම් ලබා ගත හැක.

## 2. ජීවිත රක්ෂණයක් අවශ්‍ය වන්නේ ඇයි?

ඔබ, ඔබගේ පවුලේ අදායම් උපයන්නා නම්, ඔබේ ආසන්නතම පවුලේ සාමාජිකයන්ට ඔබේ අභාවයෙන් පසු ඔවුන්ගේ මූලික අවශ්‍යතා සඳහා මුදල් සපයාගත හැකි වීමත්, ස්වකීය ජීවන මට්ටම පවත්වා ගෙන යාමට ඔවුනට හැකි වනු ඇති බවට වග බලා ගැනීමත්, අනෙකුත් බැඳියාවන් සපුරාලීම සහතික වීම වැනි කරුණු ජීවිත රක්ෂණයක් ලබා ගැනීම තුලින් අත්විඳිය හැකි ප්‍රතිලාභ වේ. එමෙන්ම ඔබගේ දූ දරුවන් හට ඔවුන්ගේ අධ්‍යාපනය සඳහා මුදල් තිබීම, ඔබ විශ්‍රාම ගන්නා විට ඔබට එකවර මුදලක් ලැබෙන හෝ නිරන්තර ආදායම් මාර්ගයක් සැලසෙන පරිදි ඔබගේ අනාගතය සඳහා ඉතිරිකිරීමේ සැලැස්මක් තිබීම හා බරපතල රෝගාබාධයක් හෝ හදිසි අනතුරක් හේතුවෙන් ඔබගේ ඉපැයුම් පහත වැටීමකදී ඔබ සතුව අතිරේක ආදායමක් තිබෙන බවට වග බලා ගැනීමද ජීවිත රක්ෂණයක් ලබා ගැනීම තුලින් ඔබට ලබාගත හැකි අමතර වරප්‍රසාද වේ.

## 3. ඔබ රක්ෂණයක් තෝරාගත යුත්තේ කෙලෙසද?

රක්ෂණයක් තෝරා ගැනීමේදී ඔබගේ අවශ්‍යතාවන්ට සරිලන රක්ෂාවරණයක්, ගෙවිය හැකි මුදලකට ලබා ගැනීමට කටයුතු කරන්න. ඔබට ඒ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැනගැනීමට අවශ්‍ය වේ නම්, ලියාපදිංචි රක්ෂණ සමාගමක හෝ ලියාපදිංචි රක්ෂණ තැරැව්කාර සමාගමක සේවයේ නිරත අදාල නිලධාරියෙකු හෝ රක්ෂණ නියෝජිතයකු මගින් අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා ගත හැක. එමගින් ඔබගේ අවශ්‍යතාවන්ට වඩාත් සරිලන රක්ෂණයක් මිලදී ගැනීමට හැකි වේ.

## 4. රක්ෂණ ඔප්පුවේ කරුණු අවබෝධ කරගැනීම වැදගත් වනුයේ ඇයි?

රක්ෂණ ඔප්පුවක් යනු රක්ෂණ ඔප්පුහිමියා වන ඔබ හා රක්ෂණ සමාගම අතර ඇති කරගන්නා නෛතික ගිවිසුමක් පිළිබඳ සාක්ෂියකි. එහෙයින් රක්ෂණ ඔප්පුවක් මිලදී ගැනීමේදී එහි ඇති නියමයන් හා කොන්දේසි පිළිබඳව ඔබ පූර්ණ අවබෝධයෙන් සිටීම වැදගත්ය. රක්ෂණ සමාගමක නිලධාරියෙකුට හෝ රක්ෂණ නියෝජිතයෙකුට කතා කිරීමෙන් ඔබට ඒ සම්බන්ධයෙන් දැනුවත් විය හැකිය. ඔබ ලබා ගන්නා රක්ෂණ ඔප්පුව සඳහා අතිරේක ආවරණ ලබා ගැනීමට අවශ්‍ය නම් ඔබගේ අවශ්‍යතාවයන් මත එම අතිරේක ආවරණ රක්ෂණ සමාගමෙන්/නියෝජිතයා ගෙන් විමසා ලබා ගත හැක. ඔබ ලබා ගන්නා අතිරේක ආවරණ සඳහා ඔබ ගෙවන වාරික මුදලට අමතරව අතිරේක ආවරණයේ වටිනාකම ද ගෙවීමට සිදු වේ.

## 5. රක්ෂණයක් ගැනීමේදී අවශ්‍ය සියලුම සත්‍ය තොරතුරු රක්ෂණ සමාගම වෙත සපයා දී නොමැති විට සිදු වන්නේ කුමක්ද?

ඔබ විසින් යෝජනා පත්‍රයෙහි සම්පූර්ණ හා නිවැරදි තොරතුරු සපයා නොමැති නම් ඔබගේ හිමිකම් පෑමක් ප්‍රතික්ෂේප කිරීමට රක්ෂණ සමාගමට පිළිවන. එබඳු තත්වයක් වලක්වා ගැනීම සඳහා සම්පූර්ණ හා නිවැරදි තොරතුරු රක්ෂණ සමාගම වෙත සපයන්න. කිසියම් තොරතුරක අදාළත්වය පිළිබඳව යම් සැකයක් ඇත්නම්, එම සැකය නිරාකරණය කිරීම හෝ ඒ පිළිබඳව ලිඛිත කරුණු පැහැදිලි කිරීමක් රක්ෂණ සමාගම වෙතින් ඉල්ලා සිටීම හෝ කළ යුතුය. අදාල යෝජනා පත්‍රය, ඔබ සහ රක්ෂණ සමාගම අතර එළඹෙන නෛතික ගිවිසුමෙහි පදනම වනු ඇත. ඔබ විසින් එම යෝජනා පත්‍රය පුරවනු ලැබීම ප්‍රඥාගෝචරය. තවද කිසිම අවස්ථාවක සම්පූර්ණ නොකරන ලද යෝජනා පත්‍රයක් (හිස් යෝජනා පත්‍රයක්) අත්සන් කිරීමෙන් වළකින්න. කෙසේ වෙතත්, තුන්වන පාර්ශවකරුවකු ඔබ වෙනුවෙන් එම යෝජනා පත්‍රය පුරවන්නේ නම්, සපයා ඇති පිළිතුරු කියවා බලා ඒවා නිවැරදි බවට සහතික වන්න. අදාල ලේඛනයට ඔබේ අත්සන යෙදූ පසු වෙනත් තැනැත්තෙකු එය පුරවා ඇත්තේ වුවද එහි අඩංගු කරුණු වල සම්පූර්ණ වගකීම පැවරී ඇත්තේ ඔබ වෙතය.

## 6. ඔබගේ රක්ෂණයට අදාළ වාරික මුදල ගෙවිය යුත්තේ කාහටද?

ඔබ වාරික මුදල ගෙවිය යුත්තේ අදාළ වාරික එකතු කර ගැනීම සඳහා බලයලත් පාර්ශවයකටය. එබඳු පාර්ශවකරුවන් වනුයේ ලියාපදිංචි රක්ෂණ සමාගමක් හෝ ලියාපදිංචි තැරැව්කාර සමාගමක් හෝ එම සමාගම් විසින් පත් කරන ලද නියෝජිතවරුන්ය. ඔබගේ වාරික මුදල්, රේඛණය කරන ලද චෙක්පත් හෝ වෙනත් අකාරයකින් (උදාඃ ස්ථාවර නියෝග, ක්‍රෙඩිට් කාඩ්පත්, සුපිරි වෙළඳසැල් හරහා) ගෙවිය හැකි අතර, රක්ෂණ සමාගම හෝ එහි ප්‍රාදේශීය/ශාඛා කාර්යාලයකට හෝ සේවා මධ්‍යස්ථානයකට නැතහොත් අදාල රක්ෂණ තැරැව්කාර සමාගම වෙත මෙන්ම ඔබගේ රක්ෂණය සම්බන්ධයෙන් ක්‍රියා කරන රක්ෂණ නියෝජිත මහතා (රක්ෂණ වාරික මුදල් එකතු කිරීමට අදාල රක්ෂණ සමාගම විසින් අවසර ලබා දී ඇත්නම්) වෙත ද රක්ෂණ වාරික ගෙවීම් සිදු කළ හැක. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු ඔබගේ රක්ෂණ සමාගම වෙතින් ලබා ගත හැක. ඔබ ගෙවන වාරික මුදල සඳහා රිසිට්පතක් ලබා ගන්න.

## 7. රක්ෂණ නියෝජිතයකුගේ කාර්යයභාරය කුමක්ද?

පාරිභෝගිකයින්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන්ට අනුකූලව වඩාත් සුදුසු රක්ෂණ ක්‍රම පිළිබඳව උපදෙස් ලබා දීම ඔවුන්ගේ ප්‍රධාන කාර්යභාරය වේ. එමෙන්ම රක්ෂණය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමෙහි ලා රක්ෂණ උපදේශකයින් විසින් වැදගත් මෙහෙයක් ඉටු කරනු ලබයි. රක්ෂණ සමාගම් සහ රක්ෂණ ඔප්පුහිමියන් සම්බන්ධ කරන පුරුකක් ලෙස ඔවුන් ක්‍රියා කරනු ලබන අතර රක්ෂණ ඔප්පු වලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලැබිය හැකි තෘප්තිමත් පාරිභෝගිකයින් බිහිකිරීම සඳහා රක්ෂණ උපදේශකයින් විශාල මෙහෙවරක් ඉටු කරනු ලබයි.

## 8. ඔබ වාරික මුදල් ගෙවීම නවතා දැමුවොත් සිදුවන්නේ කුමක්ද?

රක්ෂණ ඔප්පුව, ඔප්පුහිමියා අතට පත්වූ දිනයේ සිට දින 21 ක කාලපරිච්ඡේදයක් ඔප්පුහිමියාහට එම රක්ෂණාවරණය අඛණ්ඩව පවත්වාගෙන යන්නේද, නැතහොත් අවලංගු කරන්නේද යන්න තීරණය කිරීම සඳහා ලබා දේ. ඔබ යම් හෙයකින් එම කාලපරිච්ඡේදය තුල රක්ෂණාවරණය අවලංගු කිරීමේ විකල්පය තෝරාගනු ලැබුවහොත්, රක්ෂණ සමාගම විසින් දරන ලද වියදම්